සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I** කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (×) ලකුණ යොදන්න.

01. අභිසාරී මාධ්‍යයක් වන්නේ,
(1) විද්‍යුත් තැපෑලයි. (2) රූපවාහිනියයි.
(3) සුහුරු ජංගම දුරකතනයයි. (4) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

02. ගුරුතුමිය ඉගැන්වූ පාඩමට සවන් යොමු කළ දුෂ්මන්තා එය හොඳින් ග්‍රහණය කර ගෙන අවබෝධ කර ගත්තා ය. ඒ සඳහා බලපෑවේ ඇය සතු,
(1) සංජානන හැකියාවයි. (2) අවශ්‍යතාවයි.
(3) බුද්ධිමත් බවයි. (4) ප්‍රතිපෝෂණයයි.

03. සෞඛ්‍ය බලධාරීන් විසින් මී උණ රෝගය පිළිබඳව එවා තිබූ උපදෙස් පත්‍රිකාව ගොවීන්ට තේරුම් ගැනීමට නොහැකි වූයේ එහි තිබූ සංකීර්ණ වදන් නිසාය. එයට බලපෑ සන්නිවේදන බාධකය වූයේ,
(1) මාධ්‍ය බාධකයි. (2) අර්ථ බාධකයි. (3) පාරිසරික බාධකයි. (4) තාක්ෂණික බාධකයි.

04. ලෝක ඉතිහාසයේ බිහි වූ මුල්ම ප්‍රක්ෂේපණ යන්ත්‍රය වන්නේ,
(1) උඩිස් ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(3) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (4) මැජික් ලැන්තෑරුමයි.

05. මනාල යුවළක් ඡායාරූපයක් ගැනීමට දිය ඇල්ලක් අසලට ගොස් සූදානම් වෙත් ම මනාලයාගේ පය ලිස්සා ගොස් ජීවිතක්ෂයට පත්විය. එම සිදුවීම ජනමාධ්‍ය මඟින් ද වාර්තා විය. එය අයත් වන්නේ,
(1) දෘඪ පුවත්වලට ය. (2) කාලීන පුවත්වලටය.
(3) මෘදු පුවත්වලටය. (4) ගවේෂණාත්මක පුවත්වලටය.

06. ශ්‍රී ලංකා ගුවන්විදුලිය රාජ්‍ය ආයතනයක් ලෙස විවෘත කරනු ලැබූයේ,
(1) 1924 දී ය. (2) 1925 දී ය. (3) 1906 දී ය. (4) 1926 දී ය.

07. කමල් තම බල ප්‍රදේශය තුළ සිදු වන ප්‍රවෘත්තිමය වටිනාකමින් යුත් වැදගත් සිදුවීම් එක්තරා මාධ්‍ය ආයතනයකට වාර්තා කරයි. ඔහු,
(1) මාණ්ඩලික වාර්තාකරුවෙකි. (2) ආයතනික වාර්තාකරුවෙකි.
(3) ප්‍රදේශීය වාර්තාකරුවෙකි. (4) බීට්ටු වාර්තාකරුවෙකි.

08. පුද්ගලයින් තිදෙනෙකු විසින් ලබාගත් ඡායාරූප පිළිබඳ විස්තර පහත දැක්වේ.
A - ගුණාත්මක ඡායාරූපයක් ලැබී තිබීම.
B - අනවශ්‍ය දේ ඡායාරූපය තුළ අන්තර්ගත වී තිබීම.
C - අදාළ වස්තූන් රූපරාමුව තුළ අන්තර්ගත වී නොතිබීම.
ඉහත ආකාරයේ ඡායාරූප ලැබීම කෙරෙහි බලපා ඇති කරුණු පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) රූප සංරචනය කර තිබීම, ස්වර්ණමය රීතිය අනුගමනය නොකිරීම, විභේදන බලය අඩුවීම.
(2) විභේදන බලය වැඩි වීම, රූප සංරචනය කර නොතිබීම, ස්වර්ණමය රීතිය අනුගමනය නොකිරීම.
(3) විභේදන බලය වැඩිවීම, ස්වර්ණමය රීතිය අනුගමනය නොකිරීම, රූප සංරචනය කර නොතිබීම.
(4) රූප සංරචනය කර තිබීම, විභේදන බලය අඩුවීම, ස්වර්ණමය රීතිය අනුගමනය කිරීම.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

09. ශ්‍රී ලංකාවේ පළවන ළමා පුවත්පත් බොහොමයක් අයත් වන ප්‍රමාණ කාණ්ඩය වන්නේ,
(1) ටැබ්ලොයිඩ් ය. (2) බ්‍රෝඩ්ෂීට් ය. (3) කොම්පැක්ට් ය. (4) ෆුල් ඩිමයි ය.

10. ප්‍රතිරූප ගොඩනැගීම සම්බන්ධයෙන් දක්වා ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) යම් පුද්ගලයෙකුගේ සමාජ ප්‍රතිරූපය ගොඩනැගෙන්නේ යහපත් ආකාරයෙනි.
(2) රූපවාහිනි මාධ්‍ය මගින් සමාජ ප්‍රතිරූප ගොඩනැගීම සිදු වේ.
(3) ජනමාධ්‍ය මගින් ප්‍රතිරූප ගොඩනැගෙන්නේ සමාජ අරමුණු ඉටු කිරීමක් වශයෙනි.
(4) නළු නිළියන්, ගායක ගායිකාවන් මෙන් ම මංකොල්ලකරුවන් ද සමාජ ප්‍රතිරූපය බවට පත් කරනු ලබන්නේ ජනමාධ්‍යයයි.

11. යසුරිකා පුවත්පත් මාධ්‍ය ආයතනයක ප්‍රවෘත්ති කතුවරියක ලෙස සේවය කරයි. ඇය ප්‍රවෘත්ති රචනා කිරීමේ දී අවම අවධානයක් යොමු කළ යුතු කරුණක් වන්නේ,
(1) සාරාංශගත කර තොරතුරු ඉදිරිපත් කිරීමයි.
(2) කෙටි වැකි භාවිත කිරීමයි.
(3) ප්‍රවෘත්ති මූලාශ්‍රය පළමු ඡේදයේ අන්තර්ගත කිරීමයි.
(4) ප්‍රවෘත්තියේ වැදගත්කම අවසාන ඡේදයෙන් අවධාරණය කිරීමයි.

12. දෘෂ්ටි අඛණ්ඩතා සිද්ධාන්තය භාවිතා වන්නේ,
(1) නිර්මාණකරණයේ දී ය. (2) නිශ්චල ඡායාරූපකරණයේ දී ය.
(3) සිනමාවේ දී ය. (4) ඇස් සම්බන්ධතාවේ දී ය.

13. ගුවන්විදුලි මාධ්‍යය ක්‍රියාත්මක වන්නේ,
(1) හඬ, නිහඬ බව, සංගීතය හා ශබ්ද ඇසුරෙනි.
(2) හඬ, කෘතිම ශබ්ද, සංගීතය හා රිද්මය ඇසුරෙනි.
(3) සංගීතය, අනුකරණාත්මක ශබ්ද, නිහඬතාවය හා ශබ්ද ප්‍රයෝගය ඇසුරෙනි.
(4) සතුන්ගේ ශබ්ද, කෘතිම ශබ්ද, සංගීතය හා නිහඬතාවය ඇසුරෙනි.

14. සමන්මලී තමා නිර්මාණය කළ නව කථාව ප්‍රකාශන ආයතනයකට ලබා දීමෙන් පසු ප්‍රකාශන ආයතනය විසින් මුද්‍රණය කළ පිටපත් ප්‍රමාණය මත හා කෘතියෙහි මිල මත ඇයට මූල්‍යමය ප්‍රතිලාභයක් ලබා දෙන ලදී. එය හඳුන්වනු ලබන්නේ,
(1) ආර්ථික ප්‍රතිලාභයක් ලෙසිනි. (2) බුද්ධිමය ප්‍රතිලාභයක් ලෙසිනි.
(3) කර්තෘ භාගය ලෙසිනි. (4) ප්‍රකාශන ප්‍රතිලාභයක් ලෙසිනි.

15. සිනමා මාධ්‍ය තුළ බිහි වූ නවතම ප්‍රවණතාවය වන්නේ,
(1) චන්‍ද්‍රිකා තාක්ෂණය බිහි වීම. (2) අංකිත තාක්ෂණය භාවිත කිරීම.
(3) ද්විමාන දර්ශන නැරඹීමට හැකි වීම. (4) ත්‍රිමාන දර්ශන නරඹීමට හැකි වීම.

16. නිර්මාණයක අන්තර්ගත විය යුතු ගුණාංග වන්නේ,
(1) නිවැරදි බව හා නැවුම් බවයි. (2) නැවුම් බව හා සුවිශේෂී බවයි.
(3) නැවුම් බව හා කාලීන බවයි. (4) කාලීන බව හා නිවැරදි බවයි.

17. ප්‍රජාතන්ත්‍රවාදය අගයන නායකයෙකු සිටින සංවිධානයක විධිමත් සන්නිවේදන ක්‍රියාවලිය බොහෝ විට සිදු වන්නේ,
(1) ඉහළ සිට පහළටය. (2) පහළ සිට ඉහළටය.
(3) හරස් අතටය. (4) ප්‍රදීපාගාර ක්‍රමයටය.

18. කසුන් විශාල රෙදිපිළි වෙළඳසැලක් හිමි ව්‍යාපාරිකයෙකි. ඔහුගේ ව්‍යාපාරයට වඩාත් වැදගත්වන මාධ්‍ය උපකරණ ඇතුළත් වරණය තෝරන්න.
(1) පරිගණකය, ගණක යන්ත්‍රය, පිය වූ පරිපථ රූපවාහිනි කැමරාව
(2) මුදල් ගණින යන්ත්‍රය, පිය වූ පරිපථ රූපවාහිනි කැමරාව, විද්‍යුත් තැපෑල
(3) මුදල් ගණින යන්ත්‍රය, මුදල් සටහන් යන්ත්‍රය, පේජරය
(4) මුදල් සටහන් යන්ත්‍රය, පිය වූ පරිපථ රූපවාහිනී කැමරාව, විද්‍යුත් පිරික්සුම් උපකරණ

19. රාජ්‍ය හිමිකාරත්වය යටතේ ආරම්භ වූ මාධ්‍ය ආයතනයක් වන්නේ,
(1) ස්වාධීන රූපවාහිනියයි. (2) ලේක්හවුස් ආයතනයයි.
(3) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවයි. (4) ලක්හඬ ගුවන්විදුලියයි.

20. බහුතරයක් රූපවාහිනී ටෙලිනාට්‍ය මගින් නියෝජනය කරන්නේ,
(1) පවුල් සංස්ථාවයි. (2) සමාජ ප්‍රතිරූපයයි.
(3) පුරවැසිභාවය සංකල්පයයි. (4) මානව ධර්මතායි.

21. A - අඩු පිරිවැයක් දැරීම.
B - කොටස් වැඩි ප්‍රමාණයක් නිර්මාණය කිරීම.
C - නාට්‍ය විකාශනය කරන අතරතුර ඉතිරි කොටස් පටිගත කිරීම.
ඉහත ලක්ෂණ දක්නට ලැබෙන නාට්‍ය ප්‍රභේදය වන්නේ,
(1) ප්‍රාසාංගික නාට්‍යයයි. (2) විවිධාංගික නාට්‍යයයි.
(3) ඒකාංගික නාට්‍යයයි. (4) මෙගා නාට්‍යයයි.

22. මුල් අවධියේ ''යුගයේ ආශ්චර්ය ''නමින් හැඳින්වූයේ කිනම් මාධ්‍යය ද?
(1) රූපවාහිනිය. (2) සිනමාව. (3) ගුවන්විදුලිය. (4) පරිගණකය.

23. අභිනවයෙන් ආරම්භ කළ පෞද්ගලික බැංකුවක් මඟින් ඉතිරිකිරීමේ තැන්පතු සඳහා ඉහළ පොලී අනුපාතයක් ලබා දෙන බව රූපවාහිනී වෙළඳ දැන්වීමක් මඟින් ප්‍රචාරය කර ලදී. මෙය දුටු කමල් වෙනත් බැංකුවක දමා තිබූ මුදල් ගෙන එම බැංකුවේ තැන්පත් කරන ලදී. එසේ කිරීමට හේතු වූයේ,
(1) පුද්ගල තීරණ ගැනීමේ කාර්යය නිසා ය.
(2) විචාරශීලී ග්‍රාහකත්ව ලක්ෂණ නොතිබූ නිසාය.
(3) ආකල්පමය වෙනසක් ඇති වූ නිසාය.
(4) කාලීනව වෙනස් විය යුතු නිසාය.

24. මාධ්‍ය වෙත ප්‍රබල බලපෑමක් සිදු කිරීමට යොදා ගත හැකි ප්‍රතිචාර ක්‍රමයක් වන්නේ,
(1) දුරකථන ඇමතුම් මගින් (2) විද්‍යුත් තැපැල් ලිපි මගින්
(3) කෙටි පණිවිඩ මගින් (4) උද්ඝෝෂණ සංවිධානය කිරීම මගින්

25. එක්තරා ප්‍රදේශයකට ''මාළු වැස්සක්'' ඇද වැටුණු බව රූපවාහිනී ප්‍රවෘත්ති මඟින් ප්‍රචාරය විය. එම සිදුවීම ප්‍රවෘත්තිමය වටිනාකමක් ගෙන දීමට හේතු වූ සාධකය වූයේ ප්‍රවෘත්තියේ,
(1) කාලීන බවයි. (2) අසාමාන්‍ය බවයි. (3) අදාළ බවයි. (4) සමීප බවයි.

26. විශේෂාංග ඡායාරූප කලාවට නිදසුන් අවස්ථාවක් වන්නේ,
(1) වරාය සේවකයන්ගේ උද්ඝෝෂණය දැක්වෙන ඡායාරූපයක්
(2) ප්‍රධාන පක්ෂවල නායකයින් ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවල ඡායාරූපයක්
(3) බතික් රෙදිපිළි කර්මාන්තය පිළිබඳ තොරතුරු ඇතුළත් ඡායාරූපයක්
(4) ප්‍රබල රිය අනතුරක් පිළිබඳ ඡායාරූපයක්

27. මිනිස් සමාජයක සදාචාරාත්මක සංවර්ධනය සඳහා වැදගත් වන්නේ,
(1) සංස්කෘතියයි. (2) ආගමයි. (3) භාෂාවයි. (4) කලාවයි.

28. රූපවාහිනී මාධ්‍ය නාලිකාවක් ආරම්භ කළ රනිල්ට මූල්‍යමය ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අනුගමනය කළ හැකි හොඳම ක්‍රමවේදය වන්නේ,
(1) වෙළඳ දැන්වීම් ප්‍රචාරය කිරීම හා අනුග්‍රාහකයින් සපයා ගැනීමයි.
(2) අවම සේවක පිරිසක් බඳවා ගැනීමයි.
(3) ග්‍රාහක ආකර්ෂණය වැඩි කර ගැනීමයි.
(4) සියලු වැඩසටහන් සඳහා අනුග්‍රාහකයින් සපයා ගැනීමයි.

29. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) ලිඛිත භාෂාවට වඩා වාචික භාෂාව විධිමත් වේ.
(2) භාෂාවේ දෘශ්‍ය ස්වරූපය ලේඛනය වේ.
(3) හෙළ භාෂාව තුළ භාෂා ද්විරූපතාවය දක්නට ලැබේ.
(4) ලිඛිත භාෂාව තුළ අකුරුවලට විධිමත් හැඩයක් තිබේ.

30. A - සංදේශය වේගයෙන් පැතිරීම.
B - සංදේශය වෙනස්වීම්වලට භාජනය වීම.
C - සංදේශය ලබා දුන් ආරම්භක පුද්ගලයෙකු හඳුනාගත නොහැකි වීම.
යන ලක්ෂණ දක්නට ලැබෙන්නේ,
(1) විධිමත් සන්නිවේදනයේ ය. (2) සමූහ සන්නිවේදනයේ ය.
(3) ජන සන්නිවේදනයේ ය. (4) අවිධිමත් සන්නිවේදනයේ ය.

31. භූගෝල විද්‍යාව විෂයභාර ගුරුතුමියට පෙළපොතේ ඇති සිතියමක් විශාලනය කර පෙන්වීමට අවශ්‍ය විය. ඒ සඳහා ඇය භාවිත කළ යුතු ප්‍රක්ෂේපණ මාධ්‍ය උපකරණය වන්නේ,

(1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (4) අන්තර් ක්‍රියාකාරී පුවරුවයි.

32. ජන මාධ්‍ය ආයතනවල පැවැත්ම කෙරෙහි බලපාන සාධක වන්නේ,

(1) ක්ෂණිකව හා නිවැරදිව තොරතුරු ලබා දීමයි.

(2) ක්ෂණිකව හා සවිස්තරාත්මකව තොරතුරු ලබා දීමයි.

(3) සවිස්තරාත්මකව හා පැහැදිලිව තොරතුරු ලබා දීමයි.

(4) ක්ෂණිකව හා නිර්මාණශීලීව තොරතුරු ලබා දීමයි.

33. A - ඉඩමේ හා නිවසේ ඡායාරූපයක්.

B - ගසක ඉහළ අත්තක වසා සිටින කුරුල්ලෙකුගේ ඡායාරූපයක්.

C - ත්‍යාග ලබා ගන්නා ශිෂ්‍යයෙකුගේ ඡායාරූපයක්.

ඉහත අවස්ථා ඡායාරූපගත කිරීම සඳහා යොදාගත යුතු කාච වර්ග පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) සාමාන්‍ය කාච, පුළුල් කෝණ කාච, පටු කෝණ කාච

(2) දුර රූප කාච, සාමාන්‍ය කාච, පුළුල් කෝණ කාච

(3) පුළුල් කෝණ කාච, සාමාන්‍ය කාච, දුර රූප කාච

(4) පුළුල් කෝණ කාච, පටු කෝණ කාච, සාමාන්‍ය කාච

34. අන්තර්ජාලය යොදා ගනිමින් කිහිප දෙනෙකු අතර සිදුවන සන්නිවේදනය අයත් වන්නේ,

(1) සමූහ සන්නිවේදනයටයි. (2) අන්තර් පුද්ගල සන්නිවේදනයටයි.

(3) ජනසන්නිවේදනයටයි. (4) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයටයි.

35. Covid - 19 නිසා ප්‍රධාන වශයෙන්ම තහනමට ලක් වූ සන්නිවේදන වර්ගය වන්නේ,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනයයි. (2) ජන සන්නිවේදනයයි.

(3) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි. (4) සමූහ සන්නිවේදනයයි.

36. පුවත්පත් අන්තර්ගතයෙහි දැකිය හැකි ප්‍රවණතාවයක් නොවන්නේ,

(1) විධිමත් ප්‍රමාණයෙන් අක්ෂර මුද්‍රණය කිරීම. (2) පෙළ සමඟ රූප ද ඉදිරිපත් කිරීම.

(3) කාලානුරූපීව තොරතුරු පළ කිරීම. (4) සතිපතා හා දිනපතා පුවත්පත් පළ කිරීම.

37. මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරය කරන වෙළඳ දැන්වීමක ගාස්තුව තීරණය කිරීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන කරුණක් වන්නේ,

(1) දැන්වීමේ අන්තර්ගතයයි. (2) වෙළඳ ආයතනයේ කීර්ති නාමයයි.

(3) අවශ්‍ය ඉඩ ප්‍රමාණයයි. (4) නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රමාණයයි.

38. පුවත්පතක ඔබ පළ කර තිබූ සාවද්‍ය තොරතුරක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් පළ කරන ලෙස ඉල්ලා පැමිණිල්ලක් ගොනු කළ හැකි රාජ්‍ය ආයතනයක් වන්නේ,

(1) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමයි. (2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයයි.

(3) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවයි. (4) ජනමාධ්‍ය අමාත්‍යාංශයයි.

39. කිසියම් මාධ්‍ය නාලිකාවක් මඟින් ප්‍රචාරය කරන ලද ප්‍රවෘත්ති පිළිබඳ විශ්ලේෂණයක දී මාධ්‍ය විචාරකයෙකුගේ අවම අවධානය යොමුවිය යුතු කරුණක් වන්නේ,

(1) මාධ්‍ය හිමිකාරීත්වයයි. (2) දේශපාලනික සම්බන්ධතාවයයි.

(3) නිවේදකයාගේ ස්වරූපයයි. (4) සංස්කෘතික ස්වභාවයයි.

40. සාර්ථක ප්‍රවෘත්ති ඡායාරූපයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) අදාළ තොරතුරු ඇතුළත් වනසේ සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීමයි.

(2) වචන ඉක්මවා යන ලෙස තොරතුරු ඉදිරිපත් කිරීමයි.

(3) ආකර්ෂණීය ලෙස ඉදිරිපත් කිරීමයි.

(4) වර්ණ භාවිතා කිරීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II**

| නම/ විභාග අංකයඃ |
|---|

<u>වැදගත් :</u>

- **පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.**

01. සමන් රූපවාහිනී මාධ්‍ය පරිහරණය කිරීමට වැඩි කැමැත්තක් දක්වයි. එහෙත් ඔහු තෝරා ගත් වැඩසටහන් කිහිපයක් පමණක් නරඹයි.

(i) රූපවාහිනී මාධ්‍යයට අදාළව ග්‍රාහකයා හඳුන්වන නම කුමක් ද?

(ii) රූපවාහිනි මාධ්‍ය ආයතනයක අභ්‍යන්තර ව්‍යුහය තුළ දක්නට ලැබෙන ප්‍රධාන අංශ දෙකක් නම් කරන්න.

(iii) සමන් කොටස් දහයකින් අවසන් වූ රූපවාහිනි ටෙලි නාට්‍යයක් නැරඹුවේය. එම නාට්‍ය ප්‍රභේදය කිනම් නමකින් හැඳින්වේ ද?

(iv) රූපවාහිනී ටෙලි නාට්‍ය නරඹන අතුරතුර ඔහුට විශාල වෙළඳ දැන්වීම් ප්‍රමාණයක් ද නැරඹීමට සිදු විය. රූපවාහිනී වෙළඳ දැන්වීමක මිල තීරණය කරන සාධක දෙකක් දක්වන්න.

(v) ''දිරිය මිනිසෙකු'' නමින් විකාශනය කළ වාර්තාමය වැඩසටහනක් නැරඹූ සමන් තමා ද අනාගතයේ දී එවැනි පුද්ගලයෙකු බවට පත් වීමට තීරණය කළේ ය. ඒ සඳහා ඔහුට උපකාරී වූ සන්නිවේදන වර්ගය කුමක් ද?

(vi) ඉහත වැඩසටහන අළලා පුවත්පතක ද ලිපියක් පළ කරන ලදී. එම ලිපිය කිනම් ලිපි ප්‍රභේදයකට අයත්වේ ද?


(vii) එම ලිපිය පුවත්පතක පළ කිරීමේ දී යොදා ගත යුතු ආකෘතිය කුමක් ද?

(viii) රූපවාහිනී මාධ්‍ය තුළ ද නිශ්චල ඡායාරූප ශිල්පය භාවිතා කෙරේ. එසේ භාවිත කරන අවස්ථා දෙකක් දක්වන්න.

(ix) රූපවාහිනී මාධ්‍ය හිමිකාරත්වයේ ප්‍රධාන ආකාර දෙක දක්වන්න.

(x) රූපවාහිනී ප්‍රවෘත්තිවලට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා පාදක කරගත හැකි තොරතුරු මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02 × 10 = 20)

(02) ඉගෙනුම් ක්‍රියාවලියේ දී විවිධ සන්නිවේදන විධි ක්‍රම භාවිත කරයි.




(i) ඉහත සන්නිවේදන ආකෘතියේ A හා B නම් කරන්න. (ල. 01)

(ii) ශිෂ්‍යයෙකු ලෙස ඔබට තොරතුරු වැදගත් වන ආකාර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(iii) ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිර්මාණාත්මකව සිදු කිරීමට යොදා ගත හැකි ප්‍රකාශන විධි තුනක් විස්තර කරන්න. (ල. 03)

(iv) පාසලක් තුළ විධිමත් මෙන් ම අවිධිමත් සන්නිවේදනය ද ක්‍රියාත්මක වේ. විධිමත් හා අවිධිමත් සන්නිවේදනයේ ලක්ෂණ දෙක බැගින් දක්වා පාසල තුළ එම ලක්ෂණ දැකිය හැකි ආකාරය උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ල. 04)



*මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.*

(03) ජනමාධ්‍ය පුද්ගල ජීවිතය සමඟ දැඩිව බද්ධ වී ඇත.

(i) ශ්‍රී ලංකාවේ ආරම්භ කළ ප්‍රථම රූපවාහිනී නාලිකාව නම් කරන්න. (ල. 01)

(ii) කිසියම් සිදුවීමක් පිළිබඳ එම අවස්ථාවේ ම ග්‍රාහකයා වෙත තොරතුරු ගෙන ඒම සඳහා යොදා ගන්නා වැඩසටහන් ආකෘතිය නම් කර එසේ යොදා ගන්නා අවස්ථා උදාහරණ මඟින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(iii) ජාතික පුවත්පත් අයත්වන ප්‍රමාණ කාණ්ඩය නම් කර එහි ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) එක්තරා පෞද්ගලික ව්‍යාපාර ආයතනයක් මඟින් මාධ්‍යවේදීන් ඇගයීමේ උත්සවයක් සංවිධානය කරන ලදී. එය අයත්වන සන්නිවේදන වර්ගය නම් කර එහි විශේෂතා තුනක් පැහැදිලි කරන්න. (ල. 04)

(04) කුමාරි නවකතා පොතක් රචනා කළාය.

(i) ඇය රචනා කළ ග්‍රන්ථය සඳහා ISBN අංකය ලබාගත යුත්තේ කිනම් ආයතනය මඟින් ද? (ල. 01)

(ii) බුද්ධිමය දේපල සම්බන්ධ අයිතිවාසිකම් දෙක නම් කර ඇයට එම අයිතිවාසිකම් හිමිකම් ලබා ගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(iii) වර්තමානයේ මුද්‍රිත මාධ්‍ය තුළ බහුල ව නිශ්චල ඡායාරූප භාවිතා කෙරේ. එයින් මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි තුනක් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) කුමාරි නිර්මාණකරණයෙන් මෙන් ම සන්නිවේදන නිපුණතා අත්පත් කර ගැනීමෙන් පාසල තුළ කැපීපෙනෙන චරිතයක් බවට පත්වීමට ද තීරණය කළාය. ඒ සඳහා ඇය අත්පත් කර ගත යුතු නිපුණතා හතරක් උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ල. 04)

(05) ජනමාධ්‍ය සංවිධිතව, ආයතනිකගතව ක්‍රියාත්මක වෙයි.

(i) ආයතනයකට සම්බන්ධව කටයුතු කරන මාධ්‍යවේදීන් නම් කරන්න. (ල. 01)

(ii) ජනමාධ්‍ය කෙරෙහි රජය ඍජුවම මැදිහත්වන ආකාර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(iii) පුවත්පතක ප්‍රධාන කතෘ සතු කාර්යභාරයන් තුනක් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) රූපවාහිනී මාධ්‍ය පුද්ගල ජීවිතය කෙරෙහි මෙන් ම සමාජ ජීවිතය කෙරෙහි බලපා ඇති ආකාරය පහත කරුණු යටතේ උදාහරණ මඟින් විස්තර කරන්න.

⋆ ප්‍රචණ්ඩත්වය ⋆ ආකල්ප ⋆ දෛනික ජීවිතය ⋆ රසවින්දනය (ල. 04)

(06) සමන් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන විෂය හදාරන ශිෂ්‍යයෙකි.

(i) ගුරුතුමාට මෙම විෂය ඉගැන්වීම සඳහා යොදා ගත හැකි ප්‍රක්ෂේපණ මාධ්‍ය දෙකක් නම් කරන්න. (ල. 01)

(ii) සමන් දිනපතා පුස්තකාලයට ගොස් පුවත්පත් කියවයි. යටිකුරු පිරමීඩ ආකෘතියට අනුව ප්‍රවෘත්ති රචනා කිරීමෙන් ලැබෙන වාසි දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(iii) පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලියේ දී මාධ්‍ය උපකරණ භාවිත කිරීමෙන් අත්වන ප්‍රතිලාභ තුනක් විස්තර කරන්න. (ල. 03)

(iv) සමන් සමාජ මාධ්‍යය ද භාවිත කරයි. සමාජ මාධ්‍ය භාවිතයේ දී ඔහු විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම හතරක් පැහැදිලි කරන්න. (ල. 04)

(07) ග්‍රාහක ආකර්ෂණය රඳවා තබා ගැනීමට ජනමාධ්‍යයට නිර්මාණශීලීත්වය අවශ්‍යය වේ.

(i) මාධ්‍ය නියාමනයට ලක් කරන රජයේ ආයතන දෙකක් නම් කරන්න. (ල. 01)

(ii) තොරතුරක් සන්නිවේදනය කිරීමට පුද්ගලයෙකුට අවශ්‍යවන හැකියාවන් දෙක නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(iii) මාධ්‍ය සමාජයේ සිසුහු තම පාසලේ සිසුන්ගේ ගුවන්විදුලි මාධ්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණයක් කිරීමට තීරණය කළහ. ඒ සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරිමේ දී ඔවුන්ගේ අවධානයට ලක්විය යුතු කරුණු තුනක් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) රූපවාහිනී මාධ්‍යයේ ලක්ෂණ හතරක් පැහැදිලි කරන්න. (ල. 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(2) | 4 -(4) | 5 -(3) | 6 -(2) | 7 -(3) | 8 -(3) | 9 -(1) | 10 -(4) |
| 11-(4) | 12 -(3) | 13 -(1) | 14 -(3) | 15 -(4) | 16 -(2) | 17 -(2) | 18 -(4) | 19 -(3) | 20 -(1) |
| 21-(4) | 22 -(3) | 23 -(2) | 24 -(4) | 25 -(2) | 26 -(3) | 27 -(2) | 28 -(1) | 29 -(1) | 30 -(4) |
| 31-(3) | 32 -(1) | 33 -(4) | 34 -(2) | 35 -(4) | 36 -(4) | 37 -(3) | 38 -(2) | 39 -(3) | 40 -(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

01. (i) ප්‍රේක්ෂකයා / නරඹන්නා
(ii) ප්‍රවෘත්ති අංශය / වැඩසටහන් අංශය / දැන්වීම් අංශය / තාක්ෂණික ශිල්පීය අංශය
(iii) ප්‍රාසාංගික නාට්‍යය
(iv) දැන්වීම් ප්‍රචාරයට ගතවන කාලය / ප්‍රචාරයවන වේලාව
(v) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය
(vi) විශේෂාංග ලිපි ප්‍රභේදයට
(vii) උඩුකුරු පිරමීඩ ආකෘතිය
(viii) රූපගත කිරීම්වල දී පාත්‍ර වර්ගයාගේ, දර්ශනතලවල, අංගරචනා, වස්ත්‍රාභරණ හා පසුතල ආදියේ අඛණ්ඩතාව පවත්වා ගැනීමට / සමරු ග්‍රන්ථ, විචාර ග්‍රන්ථ, සඟරා ආදිය සඳහා / පුවත්පත් දැන්වීම් සඳහා
(ix) රාජ්‍ය හා පෞද්ගලික
(x) පුද්ගල මූලාශ්‍ර / ආයතනික මූලාශ්‍ර / ලිඛිත මූලාශ්‍ර (ලකුණු 02 × 10 = 20)

02. (i) A සම්ප්‍රේෂකයා
B අග්‍රස්ථානය (ල. 01)
(ii) අධ්‍යාපන කටයුතුවලට / නිර්මාණශීලී චින්තනයට / තීරණ ගැනීමට / ගැටලු නිරාකරණයට / සම්බන්ධතා ගොඩනගා ගැනීමට (ල. 02)
(iii) භාෂාත්මක ප්‍රකාශ විධි, දෘශ්‍ය ප්‍රකාශන විධි, ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගන්නා ආකාරය විස්තර කළ යුතුය. (ල. 03)
(iv) විධිමත් සන්නිවේදනයේ ලක්ෂණ
- නිශ්චිත බලධාරියෙකු සිටීම - උදා- පාසලේ විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති ආදිය.
- සැලසුම් සහගත බව - උදා - ආරම්භ කිරීමට හා අවසාන කිරීමට, නිශ්චිත වේලාවක් පැවතීම, කාලසටහනකට අනුව ක්‍රියාත්මක වීම ආදිය.

අවිධිමත් සන්නිවේදනයේ ලක්ෂණ
- සංදේශය වේගයෙන් පැතිරීම - උදා - සිසුන් අතර ඇති වූ ගැටුමක් පිළිබඳ ආරංචිය පැතිර යාම.
- සංදේශය ක්‍රමයෙන් වෙනස්වීම හා විකෘති වීම - උදා - ළමයින් අතර ඇති වූ ගැටුමට හේතු ලෙස විවිධ හේතු ප්‍රකාශ කිරීම.

ආදී ලෙස උදාහරණ මඟින් පැහැදිලි කර තිබිය යුතුය. (ල. 04)

03. (i) ස්වාධීන රූපවාහිනී සේවය (ල. 01)
(ii) සජීවී වැඩසටහන් - උදා - නිදහස් උත්සව වැනි ජාතික උත්සව අවස්ථාවල, ක්‍රිකට් තරග පවත්වන අවස්ථාවල, මැතිවරණ පවත්වන දිනවල ආදිය (ල. 02)
(iii) බ්‍රෝඩ්ෂීට් පුවත්පත් (ල. 01)
<u>ලක්ෂණ</u>
පළල් පිටු සහිත වීම / ජාතික හා අන්තර්ජාතික තේමාවලින් යුක්ත වීම / උසස් මට්ටමේ ජනසන්නිවේදන ක්‍රියාකාරකම්වලින් යුතු වීම / නිශ්චිත හා විධිමත් ආකෘතියකින් යුතුවීම ආදී කරුණු 02 ක් විස්තර කළ යුතුය. (ල. 02)
(iv) සමූහ සන්නිවේදනය (ල. 01)
විශේෂතා
- සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධවන පුද්ගල සංඛ්‍යාව මත සමූහ සන්නිවේදනය අර්ථ දැක්වීම.
- සමූහ කුඩා හෝ විශාල විය හැකි වීම.
- සජීවී ක්‍රියාවලියක් වීම.
- බොහෝ විට ඒකපාර්ශවීය සන්නිවේදනයක් සිදු වීම.
- සන්නිවේදකයා ඉදිරියේ සිටින සමූහය සන්නිවේදකයා දන්නා අයගෙන් මෙන් ම නොදන්නා අයගෙන් ද සමන්විත විය හැකි වීම.
- න්‍යාය පත්‍රයක් තිබීම ආදී කරුණු විස්තර කළ යුතුය. (ල. 03)

04. (i) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් (ල. 01)

(ii) ආර්ථික අයිතිවාසිකම් හා සදාචාරාත්මක අයිතිවාසිකම් හිමිවන ආකාරය කෙටියෙන් විස්තර කළ යුතුය. (ල. 02)

(iii) අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට හැකි වීම / තාත්වික බව නිසා ග්‍රාහක විශ්වසනීයත්වය දිනා ගැනීමට හැකි වීම / පහසුවෙන් ග්‍රාහක ආකර්ෂණය ලබා ගැනීමට හැකි වීම / ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට හැකිවීම ආදී කරුණු තුනක් විස්තර කළ යුතුය. (ල. 03)

(iv)
- තමා සතු තොරතුරු අදහස් ප්‍රමාණය පුළුල් කර ගැනීම.
- කථන රටා පුහුණු වීම.
- කථනය සඳහා පෙර සූදානම.
- අන්‍යයන්ගේ කථා හා අංගචලන හා ඉරියව් අධ්‍යයනය කිරීම.
- සවන් දීමට පුහුණු වීම.
- කථනය සමග අංගචලනය හා ඉරියව් භාවිත කිරීමට පුහුණු වීම. ආදී කරුණු 04 ක් විස්තර කළ යුතුය. (ල. 04)

05. (i) ප්‍රදේශීය මාධ්‍යවේදීන් / මාණ්ඩලික මාධ්‍යවේදීන් (ල. 01)

(ii) බලපත්‍ර ලබාදීම / විවිධ කොන්දේසි පැනවීම / සේවාවන් අත්හිටු වීම / ප්‍රවෘත්ති ඇතුළු වෙනත් සංදේශ වාරණය කිරීම / ජනමාධ්‍ය ආයතන රජයට පවරා ගැනීම / බදු පැනවීම / රජයේ මාධ්‍ය ආයතනවලට මාධ්‍යවේදීන් පත් කිරීම ආදිය. (ල. 02)

(iii) කතුවැකිය ලිවීම / පුවත්පතේ අන්තර්ගතය හා ව්‍යුහය පිළිබඳ සමස්ත වගකීම දැරීම / නඩු කටයුතුවල දී නෛතික වගකීම දැරීම / තමාට පහළ මාධ්‍යවේදීන් වෙත කාර්යයන් බෙදා දීම ආදී කරුණු 03 ක් විස්තර කළ යුතුයි. (ල. 03)

(iv) ප්‍රචණ්ඩත්වය - කාටූන් චිත්‍රපට, නාට්‍ය, ප්‍රවෘත්ති වැඩසටහන් හරහා එය සිදුවන ආකාරය
ආකල්ප - සිතුම් පැතුම් කෙරෙහි ජනමාධ්‍ය බලපා ඇති ආකාරය.
දෛනික ජීවිතය - තම දෛනක ජීවිතය ජනමාධ්‍යට බලපා ඇති ආකරය, හැඩ ගැසී ඇති ආකාරය
රසවින්දනය - අවර ගණයේ පහත් රසවින්දනයට යොමු වී ඇති ආකාරය උදාහරණ මගින් විස්තර කළ යුතුය. (ල. 04)

06. (i) ප්‍රතිශිර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය / කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය / බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය / අන්තර් ක්‍රියාකාරී පුවරුව / ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය (ල. 01)

(ii) පුවත්පතේ ඉඩකඩ සීමා වන අවස්ථාවල දී ප්‍රවෘත්තියේ හරයට හානියක් නොවන පරිදි අවසාන කොටස් ඉවත් කල හැකි වීම / පාඨකයාට තම කාලය ඉතිරි කර ගනිමින් පහසුවෙන් වැදගත් කරුණු ග්‍රහණය කර ගත හැකි වීම (ල. 02)

(iii) ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පහසුවීම / ඵලදායී වීම / වඩා උද්යෝගීමත් හා ආකර්ෂණීය බව / තොරතුරු ග්‍රහණය කර ගැනීමට තේරුම් ගැනීමට මතකයේ රඳවා ගැනීමට ශිෂ්‍යයන්ට පහසු වීම / ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රියජනක වීම ආදිය කරුණු 03 ක් විස්තර කළ යුතුයි. (ල. 03)

(iv) තමා පිළිබඳ සත්‍ය තොරතුරු වසන් කරමින් අන් අය රැවටීමෙන් වැළකීම / වැරදි හා අසත්‍ය තොරතුරු ජාලයට එක් කිරීමෙන් වැළකීම / තම පෞද්ගලික තොරතුරු අන් අය වෙත ලබා දීමෙන් වැළකීම / සමාජ සදාචාරයට හානි නොවන සේ භාවිත කිරීම / අන් අයගේ පෞද්ගලිකත්වයට හානි නොකිරීම ආදී කරුණු 04 ක් විස්තර කළ යුතුය. (ල. 04)

07. (i) විදුලි සංදේශ නියාමන කොමිසම / රූගුම් පාලක මණ්ඩලය / පුවත්පත් මණ්ඩලය / පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (ල. 01)

(ii) භාෂා හැකියාව හා සන්නිවේදන හැකියාව
භාෂා හැකියාව එදිනෙදා භාවිතයක් සමඟ ප්‍රගුණ කර ගත හැකි හැකියාවකි. සන්නිවේදන හැකියාව පුද්ගලයෙකුට සහජයෙන් හා භාවිතය තුළින් ඇතිවන හැකියාවකි. සන්නිවේදන හැකියාවෙන් යුතු පුද්ගලයාට ග්‍රහකයා පොළඹවා ගැනීමේ හැකියාව ඇත. ඒ සඳහා ඔහු තොරතුරක් අපූර්ව ආකාරයෙන් ආකර්ෂණීයව හා නිර්මාණශීලීව ලබා දෙයි. (ල. 02)

(iii) අදාළ තොරතුරු පමණක් විමසීම / ලබා ගන්නා තොරතුරුවල රහස්‍ය භාවය රැක ගැනීම / ලබා ගන්නා තොරතුරු අදාළ සමීක්ෂණයට පමණක් යොදා ගන්නා බවට සහතික වීම / තොරතුරු ඉල්ලා සිටීමට හේතුව ප්‍රකාශ කිරීම / සමීක්ෂණයට භාජනය වන පුද්ගලයා ලබා දීමට අකමැති තොරතුරු ඉල්ලා නොසිටීම. ආදී කරුණු 04 ක් විස්තර කළ යුතුයි. (ල. 03)

(iv) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි / සමීප මාධ්‍යයකි / සජීව මාධ්‍යයකි / අස්ථායී මාධ්‍යයකි / වියදම් අධික මාධ්‍යයකි / ජනමාධ්‍යයකි. ආදී කරුණු 04 ක් විස්තර කළ යුතුය. (ල. 04)



අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට
www.lol.lk
Learn Ordinary Level
LOL.lk online Book Store
අමතන්න - 071 777 4440/0756999990/071 8540371
G.C.E. O/L PAST PAPERS
අ.පො.ස. සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර
2010 සිට 2019 දක්වා
A+ GUIDE PAST PAPERS
ගණිතය MATHEMATICS
විද්‍යාව SCIENCE
ඉතිහාසය HISTORY
සිංහල භාෂාව හා සාහිත්‍යය SINHALA LANGUAGE AND LITERATURE
සංගීතය (පෙරදිග) MUSIC (ORIENTAL)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය INFORMATION & COMMUNICATION TECHNOLOGY
සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය HEALTH AND PHYSICAL EDUCATION
භූගෝල විද්‍යාව GEOGRAPHY
ඉංග්‍රීසි භාෂාව ENGLISH LANGUAGE
නාට්‍ය හා රංග කලාව DRAMA AND THEATRE
නැටුම් (දේශීය) DANCING (ORIENTAL)
කතෝලික ධර්මය CATHOLICISM
ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය BUSINESS & ACCOUNTING STUDIES
බුද්ධ ධර්මය BUDDHISM
චිත්‍ර ART
Ex/Press/2019/0034
Online shopping
www.lol.lk
Learn Ordinary Level
DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

LOL.lk
online Book Store
071 777 4440/0756999990/071 8540371


## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්
# ගෙදරටම ගෙන්ව ගන්න
# ඔන්ලයින් ඔඩර් කරන්න
# WWW.LOL.LK
# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers